# අනාගත ලෝකය



## අභ්‍යවකාශ තරණය

Ares I යනු, Saturn V ගඟන යානාවට පසු නාසා ආයතනය විසින් නිපදවන ලද වර්ධක රොකට්ටුවයි.(booster) 2014 දී මෙමඟින්, අජටාකාශගාමීන් පෘථිවි කක්ෂය වෙත රැගෙන ගොස් 2020 දී, සඳ මතට රැගෙන යාමට සැලසුම් කර තිබේ. මෙය නියත වශයෙන් ම සිදු විය හැකි අනාවැකියකි. රොකට්ටුවේ අනිත් සගයා වන Ares V මෙන්ම Ares I ද නිවැරදිව සකසන ලද ෂටලයකින් ද ඇපලෝ එන්ජින් වලින් ද සමන්විත ය.Ares V හි කාර්යභාරය වන්නේ සඳවෙත රොකට්ටුවක් හා අභ්‍යවකාශ තරණ සඳහා උපයෝගී කර ගන්නා දෘඩාංග නිකුත් කිරීමත් ය.

Ares I රොකට් කොටස් දෙකකින් සමන්විත ය. ඒවායේ රැගෙන යන භාරය ටොන් 23 කි. පළමු කොටස ඝන ඉන්ධනවලින් ද, දෙවන කොටස ද්‍රව ඉන්ධනවලින් ද ක්‍රියාත්මක වෙයි. එහි ප්‍රථම අත්හදා බැලීම 2009 දී සිදු කිරීමට නියමිත ය.

ගත වූ දශක කීපය තුළ අඟහරු වෙත යවා ඇති සෙවුම් උපකරණ ප්‍රමාණය 6 ක් පමණ වෙයි. (රෝවර්) Rovers දෙකත් තවමත් එහි මතුපිට සැරිසරයි. තවත් සෙවුම් උපකරණයක් අඟහරු වෙත යැවෙනPhoenix මෙහෙයුම අගෝස්තු මසදී ඇඹෙන අතර, යානය 2008 දී අඟහරුගේ උත්තර ධ්‍රැවය මත ගොස් පතිතකරයි. අඟහරු ධ්‍රැවය මත තිබෙන අයිස් සිදුරුකර යටින් ඇති භූමියේ, කෙදිනක හෝ ජීවියකු සිටි බවට සලකුණු තිබේදැයි නිරීක්ෂණය කිරීම එම යානයේ කාර්යය වනු ඇත.




## නව ඖෂධ

පියයුරු පිළිකා සෛල මර්දනය සඳහා රසායනික චිකිත්සාව සමඟම යොදා ගත හැකි නව ඖෂධයකට අනුමැතිය ලබාදීමට ඇ.එ.ජනපදයේ ආහාර හා ඖෂධ පාලනාධිකාරිය බලාපොරොත්තුවෙන් සිටියි. එමෙන්ම, මුල් අවස්ථාවේදීම HIV වෛරසය, ශරීරයේ සෛලවලට ඇතුළුවීමට බාධා පමුණුවන ඖෂධ වර්ගයක් ද මෙම වසරේදී වෙළඳපලට එනු ඇත. මීට අමතරව gaboxadol නම් ප්‍රතිකාර ක්‍රමය, වසර අගභාගය වන විට හඳුන්වා දෙනු ලබන්නේ, නින්ද නොයාමේ අසීරුතාවෙන් පෙළෙන පුද්ගලයන් වෙනුවෙනි. දැනට පවතින ඖෂධ මෙන් නොව, ඇබ්බැහිවීමේ ප්‍රවණතාව ඉතා අඩුවීම මෙහි ඇති විශේෂත්වයයි.



## ස්වභාවික පරිසරය

ගෝලීය උණුසුම්වීම නමැති පරිසර ඛේදවාචකය හඳුනා ගැනීමටත්, ඊට ප්‍රධාන හේතුව මානවක්‍රියාකාරකම් බවත් තහවුරු කිරීමට වසර 100 ක් පමණ ගත විය. ගෝලීය උණුසුම් පිළිබඳව අන්තර් රාජ්‍ය සභාව(IPCC) නිවේදනයක් නිකුත්කරමින් කියා සිටින්නේ මෙම තත්ත්වය පාලනය කිරීමෙහිලා ලෝක වාසීන් සියලු දෙනාම එකමුතු විය යුතු බවයි. අප්‍රියෙල් හා මැයි මාසවලදී නිකුත් කරනු ලබන සභාවේ මීළඟ තක්සේරු වාර්තා දෙකින් (War and Peace) දේශගුණ වෙනස්වීම්වල බලපෑමත්, ඒවා පාලනය කිරීම පිළිබඳවත් කරුණු ඉදිරිපත් වනු ඇත.

මෙම වසරේ දෙසැම්බර් මාසයේ දී එක්සත් ජාතීන් ගේ දේශගුණ වෙනස්වීම් පිළිබඳ ව්‍යූහගත සමුළුවේ 13 වන සංවත්සරික හමුව ඉන්දුනීසියාවේ බාලි දූපතේ දී පැවැත් වේ. මෙම සමුළුවේ, පසුගිය වාරවලදී, සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර කලබලකාරී අවස්ථා හටගැනුණ ද, 2007 වසර දී වඩාත් ඵලදායී ලෙස සමුළුව පැවැත්වීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය බලාපොරොත්තු වේ. පෙබරවාරි මාසයේ දී, වොෂින්ටන් නුවරට රැස් වූ, G 8 කණ්ඩායමේ නියෝජිතයෝ, වායුගෝලයට මුදාහරින කාබන් ප්‍රතිශතය අඩුකිරීමේ වැදගත්කම පිළිබඳව සාකච්ඡා කළහ. කියෝතෝ සම්මුතියෙන් ඉවත් වූ චීනය හා ඉන්දියාව පිළිබඳව දැඩි අවධානයක් යොමු විය.

2007 වසර තුළදී, පරිසරය පිළිබඳ වැඩි අවධානයක් යොමු කරනු ලබයි. එය අන්තර්ජාතික තල්මසුන්ගේ වර්ෂය ලෙස දැනටමත් නම් කර තිබේ. රටවල් 73 කින් සමන්විත ජාත්‍යන්තර තල්මසුන්ගේ කොමිසම, ස්වකීය වාර්ෂික හමුව මෙවර පවත්වන්නේ, මැයි මස ඇන්කොරාග් නගරයේ ය. තවද 2007 වර්ෂය, ජාත්‍යන්තර ධ්‍රැවීය වසරත්, සූර්යගෝල අධ්‍යයන වර්ෂය ලෙසත් හඳුන්වා ඇති අතර චීනය 2007 වසර වෙන් කර තිබෙන්නේ ඌරන් වෙනුවෙනි.



## තාක්ෂණය

බෝයින්ග් 787 නවතම ගුවන් යානය 2007 වසරේ අගෝස්තු මසදී ප්‍රථම වරට ගුවන්ගත වෙයි. එය මඟින් ගෙනයාම ආරම්භ කරනුයේ ලබන වසරේ සිටය. දැනට ඉහළම තාක්ෂණයක් සහිත වෙළඳ ගුවන් යානය මෙය වන අතර ගුවන් සේවා 37 ක් බෝයින්ග් 787 යානා මිලදී ගැනීම සඳහා ගිවිසුම් අස්සන් කර ඇත. බෝයින්ග් සමාගම පවසන පරිදි යානයේ ඉන්ධන කාර්යක්ෂමතාව එම ප්‍රමාණයේ අනිත් යානාවලට වඩා 20% කින් වැඩිය. සාමාන්‍යයෙන් වියළි බවකින් යුක්ත ඇතුළත වායුව තෙත් සහිත කිරීමේ හැකියාවක් ද මෙම ගුවන්යානාවට තිබේ.



## ප්‍රතිදීප්ත විදුලි පහන

තම ආයතනය විසින් නිපද වූ අලුත්ම, සුසංහිත ප්‍රතිදීප්ත විදුලි පහන(CFL) මෙම වසර අගදී හඳුන්වාදීමටWAL - MART ආයතනය සූදානම් වෙයි. සාමාන්‍ය විදුලි බල්බයකට වඩා කීප ගුණයක් මිලෙන් වැඩි වුවද, මෙම CFL බල්බයට වැය වන විදුලිය සාමාන්‍ය බල්බයකට වඩා 75% කින් අඩුය. එය වසර ගණනාවක් පාවිච්චි කළ හැකිය.

පරිවර්තනය

**දිනිති නිශ්ශංක**

ටයිම් ඇසුරිනි